මගේ අංකය
எனது இல.
My No.

ඔබේ අංකය
உமது இல.
Your No .

දිනය
திகதி
Date. 2019.05.16

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
## இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
## Human Rights Commission of Sri Lanka

සියළුම විද්‍යුත් මාධ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

පසුගිය අප්‍රේල් මස 21 වන දින දිවයිනේ ප්‍රදේශ කිහිපයක සිදු වූ ප්‍රචණ්ඩකාරී සිදුවීම් හේතුවෙන් ජීවිත අහිමිවීම් සහ බරපතල ලෙස තුවාල සිදුවීම නිසා විශාල පිරිසකට රෝහල්ගත වීමට සිදුවිය. මෙම ප්‍රචණ්ඩකාරී සිදුකිරීම් අන්තවාදී කණ්ඩායමක් විසින් සිදුකරන ලද බවට මේ වන විට හදුනාගෙන ඇත.

උක්ත සිදුවීමෙන් අනතුරුව ආරක්ෂාව තහවුරු කිරීම සදහා ආරක්ෂක අංශ ක්‍රියාත්මකවීමක් සිදුවන අතර, සැක කටයුතු පාර්ශවයන් අත්අඩංගුවට ගැනීම් ද සිදුවෙමින් පවතී. එමෙන්ම රට තුළ හදිසි අවස්ථා ප්‍රකාශ කර ඇත. ආරක්ෂක පියවරක් ලෙස අනන්‍යතාවය තහවුරු කිරීමට බාධා වන දේ පැළදීම තහනම් කර ඇත.

මෙම ත්‍රස්තක්‍රියා හේතුවෙන් අසාධාරණ හා පදනම් විරහිතව සමස්ත මුස්ලිම් ජන කණ්ඩායමම සැකයට පාත්‍රවීම හා අවමානයට ලක්වීමේ තත්වයක් නිර්මාණය වී ඇත. එබැවින් ප්‍රවෘත්ති විකාශනය කිරීමේදී වඩාත් සංවේදීව කටයුතු කිරීමේ අවශ්‍යතාවය අප පැහැදිලිව නිරීක්ෂණය කරනු ලැබේ.

රටේ පුරවැසියන් අතර වර්ගික හා ආගමික සම්බන්ධතාවයන් ඇති කිරීම පිණිස ජනමාධ්‍ය වෙතින් වගකීමකින් විශාල කාර්ය භාරයක් සිදුකළ යුතුව ඇති බව අප සියළුදෙනාම පිළිගන්නා කරුණක් වේ. ඒ අනුව ජනමාධ්‍ය ආයතන තමන්ගේ මාධ්‍ය කටයුතු වලදි පහත කරුණු පිළිබද සංවේදී වනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරයි:

01. ජන වර්ග අතර වෛරය වර්ධනය වන ආකාරයේ පුවත් විකාශනය නොකිරීම. විශේෂයෙන්ම පුවත් විකාශනය කරන විට එම පුද්ගලයාගේ ආගමික හෝ වාර්ගික පසුබිම එම පුද්ගලයා හදුන්වා ගැනීමට යොදා නොගැනීම;

02. හුදෙක් කටකතා ලෙස පවතින තොරතුරු ප්‍රවෘත්ති ලෙස විකාශනය නොකිරීම;

03 මානසික වශයෙන් කම්පන ඇතිවන බිහිසුනු සිද්ධි, මෘත ශරීර, අවිආයුධ, ගිනි ගැනීම්, පිපිරීම් වැනි සිද්ධීන් හි රූප රාමු හෝ වීඩියෝ දර්ශන විකාශනය නොකිරීම. මෙහිදී දරුවන්ට ඇතිවිය හැකි මානසික කම්පනය පිළිබද දැඩි අවධානය යොමු කිරිම;


ප්‍රධාන කාර්යාලය / தலைமைக் காரியாலயம் / Head Office: 14, ආර්. ඒ. ද. මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு-04. / 14, R.A.De Mel Mawatha, Colombo - 04.
දුරකථන / தொலைபேசி / Telephone: 94-11- 2505580/81/82
සභාපති / தவிசாளர் / Chairperson: 011-2505451
ලේකම් / செயலாளர் / Secretary: 011-2505521
ෆැක්ස් / தொலைநகல் / Fax: 011 2505541/74
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2505575 / 1996
විද්‍යුත් තැපැල / மின்னஞ்சல் / E-mail: sechrcsl@gmail.com
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

04. ආරක්ෂක අංශ විසින් සිදුකරන සෝදිසි මෙහෙයුම් පිළිබඳ තොරතුරු ප්‍රචාරය කිරීමේ දී පුද්ගලයන්ගේ පෞද්ගලිකත්වයට ගරු කිරීම;

05. නීතියේ රැහැනට හසුකරගන්නා පුද්ගලයින්ගේ හා විශේෂයෙන්ම ඔවුන්ගේ පවුල්වල සාමාජිකයින්ට අවමානයක් නොවන අයුරින් එම ප්‍රවෘත්ති විකාශනය කිරීම;

06. ප්‍රවෘත්ති ප්‍රචාරයේ දී පූර්ව සංරක්ෂිත දර්ශන යොදාගැනීමේ දී, පවතින ගැටළුකාරී තත්වය තීව්‍ර වීමට ඉවහල් විය හැකි රූප රාමු භාවිතා නොකිරීම;

07. රෝගීන්ගේ, වින්දිතයින්ගේ හෝ අත්අඩංගුවට ගනු ලබන පුද්ගලයින්ගේ කටහඬ ඔවුන්ගේ අනුදැනුමකින් හෝ කැමැත්තකින් තොරව ප්‍රචාරය නොකිරීම;

08. ශ්‍රී ලංකාව විසින් පිළිගෙන ඇති ජාත්‍යන්තර නීතිය යටතේ රැකවරණය ලබන ජන කණ්ඩායම්වලට එරෙහිව වෛරය ගොඩ නැගෙන ආකාරයේ පුවත් විකාශනය නොකිරීම (ශ්‍රී ලංකාව තුළ තාවකාලිකව වෙසෙන සරණාගතයින්).

ඉහත කරුණු සැළකිල්ලට ගනිමින් ජනතා යහපත පිණිස මාධ්‍ය ආයතන විසින් තම මාධ්‍ය කටයුතු සංවේදීතාවයෙන් සිදු කරනු ඇතැයි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව අපේක්ෂා කරනු ලබයි.

Dr. N. D. Udagama
Chairperson
Human Rights Commission of Sri Lanka

සභාපතිනි,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

පිටපත් : 01. ලේකම්, ජනමාධ්‍ය අමාත්‍යාංශය
02. සභාපති, විදුලි සංදේශන නියාමන කොමිෂන් සභාව
03. රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
04. ලේකම්, විකාශකයන්ගේ සංසදය